# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

**ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2022**
**2024 ඔක්තෝබර්/නොවැම්බර්**

**මානවශාස්ත්‍ර පීඨය**

## බෞද්ධ මනෝවිද්‍යාව

**බෞද්ධ මනෝවිද්‍යාව හැඳින්වීම හා භාරතීය මනෝවිද්‍යාවෙහි දාර්ශනික පසුබිම BUPS – 18214**

යටත් පිරිසෙයින් එක් කොටසකින් එක් ප්‍රශ්නය බැගින්වත් ඇතුළත් වන සේ තෝරාගත් ප්‍රශ්න **පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 10 යි.** **කාලය : පැය 03 යි.**

---

### I කොටස

01. බෞද්ධ මනෝවිද්‍යා විෂය ක්ෂේත්‍රය පිළිබඳ අවධානය යොමුකරමින් එහි ස්වභාවය සහ අරමුණු පැහැදිලි කරන්න.

02. මනස පිළිබඳ බෞද්ධ විග්‍රහයෙහි පවතින මනෝවිද්‍යාත්මක අගය අදාළ මූලාශ්‍රය ඇසුරින් තහවුරු කරන්න.

03. 'මනෝරෝග' යන්න නිර්වචනය කොට පුද්ගලයා මානසිකව රෝගී තත්ත්වයට පමුණුවන සාධක මොනවාදැයි බෞද්ධ මූලාශ්‍රය ඇසුරින් පැහැදිලි කරන්න.

04. මානසික අක්‍රමතාවන් සඳහා යෝග්‍ය මනෝ ප්‍රතිකාර ක්‍රම බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් ප්‍රකට වන ආකාරය පෙන්වා දෙන්න.

05. මනසෙහි සැකැස්ම හා ක්‍රියාකාරිත්වය විෂයෙහි සංජානන ක්‍රියාවලිය හා විෂයීය ලෝකය බලපාන ආකාරය අදාළ මූලාශ්‍රයානුසාරයෙන් අනාවරණය කරන්න.

### II කොටස

06. කායික සහ මානසික ස්වස්ථතාව සඳහා යෝග අභ්‍යාසයන් උපයෝගී වන ආකාරය ගෙනහැර දක්වන්න.

07. ජෛන දර්ශනය සැකෙවින් හඳුන්වා ජෛන සංකල්පයන්හි අන්තර්ගත මනෝවිද්‍යාත්මක අගය පරීක්ෂා කරන්න.

08. උපනිෂද් ඉගැන්වීම් තුළ පුරාතන භාරතීය සමාජයේ පුද්ගල මානසික යහපැවැත්ම තහවුරු කොට ඇති ආකාරය පැහැදිලි කරන්න.

09. සංහිතා තුළින් නිරූපණය වන මනෝවිද්‍යාත්මක ප්‍රවණතා සමාලෝචනය කරන්න.

10. වෛශේෂික දර්ශනයෙහි ප්‍රත්‍යක්ෂය හා අනුමානය මනෝවිද්‍යාත්මක පදනමකින් සංග්‍රහ වී ඇති ආකාරය අධ්‍යයනය කරන්න.

**********************************